# කාන්තාව පිළිබඳ බෞද්ධ හා බ්‍රාහ්මණ ඉගැන්වීම්හි දක්නට ලැබෙන විෂමතා

*සුදස්සන, පූජ්‍ය වලස්මුල්ලේ [1] සහ ජයවර්ධන, ඒ. ඕෂධී නිමේෂා [2]*

බ්‍රාහ්මණ ඉගැන්වීම් මගින් කාන්තාවගේ අයිතිවාසිකම් අමානුෂික ලෙස අහෝසිකර තිබූ ආකාරය හා එම ඉගැන්වීම් සාධාරණ නොවන බව ප්‍රකට කරමින් බෞද්ධ ඉගැන්වීම් තුළ කාන්තාවට තිබිය යුතු නිදහස හා ඇය ඇගයුමට ලක්කොට තිබෙන ආකාරය කෙබඳුද යන්න විමසීම මෙම පර්යේෂණයේ අරමුණයි. බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව කාන්තාව උපතින්ම අපිරිසිදු තැනැත්තියක් ලෙස හඳුන්වමින් ඇයට හිමි එකම කාර්යය ස්වාමිපුරුෂයා සතුටු කිරීම හා දරුවන් තැනීමට දායක වීම පමණක් බව අවධාරණය කරමින් සාමාජික, ආගමික, ආර්ථික, දේශපාලනික සහ අධිකරණ යනාදි කිසිදු අංශයකින් ඇයට පිහිටක් නොලැබුණි. කාන්තාව සතුව පවතින සහජ නාරි ලාලිත්‍යය හා සුකුමාල බව ආදි ලක්ෂණ පවා උපහාසයට ලක්කෙරුණි. ඇය ඇගයුමට ලක් කරනු ලැබූයේ පුරුෂයාට කාම වස්තුවක් ලෙස පමණි. ඒ බව මනුස්මෘතිය ග්‍රන්ථයෙහි සඳහන් වේ. බෞද්ධ ඉගැන්වීම් මගින් ප්‍රකට වන්නේ කාන්තාවට ඉහළ ඇගයුමක් ලබාදී ඇයට මවක් හා බිරිඳක් වශයෙන් පවුල් සංස්ථාව තුළ ගෞරවනීය තැනැත්තියක් ලෙස ගෞරවනීය තත්ත්වයට පත්කොට තිබෙන බවයි. තවද ආගමික වශයෙන් විමුක්තිය ලැබීමටද හැකි බව පෙන්වාදෙමින් ඇයට පූජනීයත්වයට පත්වීමටද හැකියාව පවතින බව අවධාරණය කරයි. මෙම පර්යේෂණය සඳහා ත්‍රිපිටකය මූලාශ්‍රය වශයෙන් යොදා ගෙන ඇත. පුද්ගල චර්යාව මිස ලිංග භේදය පුද්ගලයාගේ වටිනාකම තීරණය නොකරන බව මෙම පර්යේෂණයෙන් නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පදඃ බ්‍රාහ්මණ ඉගැන්වීම්, කාන්තාව, බෞද්ධ ඉගැන්වීම්

[1] *ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) තෙවන වසර, ඉතිහාස අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*wsudassana@gmail.com*
[2] *ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, ඉතිහාස අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*jayawardanaarachchillaya@gmail.com*